# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2177/2 - 2020 මැයි මස 26 වැනි අඟහරුවාදා - 2020.05.26

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස : (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

### 2018 අංක 35 දරන මුදල් පනත යටතේ නිවේදනය

2018 අංක 35 දරන මුදල් පනතේ 19 වැනි වගන්තිය සමග කියවෙන එකී පනතේ 51 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, මෙම නියමය මගින් අංක 2153/29 දරන 2019 දෙසැම්බර් 14 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රය මගින් සහ අංක 2163/26 දරන 2020 පෙබරවාරි 20 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රය මගින් සංශෝධිත පරිදි අංක 2147/72 දරන 2019 ඔක්තෝබර් 31 දිනැති *අති විශෙෂ ගැසට්* පත්‍රයේ පළ කරන ලද, 2019 අංක 2 දරන මුදල් (මෝටර් වාහන මත සුබෝපභෝගී බද්ද) නියෝග එහි 4 වන නියෝගය ඉවත්කර ඒ වෙනුවට පහත සඳහන් නියෝගය ආදේශ කිරීම මගින් සංශෝධනය කරමි.

"4. පහත මෝටර් වාහන මත සුබෝපභෝගී බද්ද ශුන්‍ය අනුප්‍රමාණයට (0%) අදාල විය යුතුය :

(අ) 2019 මාර්තු මස 05 වන දින හෝ ඊට පෙරාතුව විවෘත කරන ලද ණයවර ලිපියක් මත ආනයනය කරන ලද මෝටර් වාහනයක් මත, එකී ණයවර ලිපියේ සඳහන් මෝටර් වාහනයේ විස්තරය හෝ ප්‍රමාණය හෝ වාහනයේ තාක්ෂණික පිරිවිතර හා එකී ණයවර ලිපියේ වටිනාකම සහ කල්පිරෙන දිනය සංශෝධනය නොකිරීමට සහ එකී මෝටර් වාහනය 2019 දෙසැම්බර් 31 වැනි දින හෝ ඊට පෙරාතුව ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගනු ලැබීමට යටත්ව;

(ආ) 2019 මාර්තු මස 06 වන දින සිට 2019 ඔක්තෝබර් මස 31 වැනි දින දක්වා කාලය තුළ විවෘත කරන ලද ණයවර ලිපියක් මත ආනයන කරන ලද සිලින්ඩර ධාරිතාව 1,800 සී. සී. නොඉක්මවන ඕනෑම පෙට්‍රල් මෝටර් වාහනයක් හෝ සිලින්ඩර ධාරිතාව 2,300 සී. සී. නොඉක්මවන ඕනෑම ඩීසල් මෝටර් වාහනයක් හෝ එන්ජිමෙහි බලය කි.වො. 200 නොඉක්මවන විදුලි බලයෙන් ක්‍රියා කරන ඕනෑම වාහනයක් මත, එකී ණයවර ලිපියේ සඳහන් මෝටර් වාහනයේ විස්තර හෝ ප්‍රමාණය හෝ තාක්ෂණික පිරිවිතර හා එකී ණයවර ලිපියේ වටිනාකම හෝ කල්පිරෙන දිනය සංශෝධනය නොකිරීමට සහ 2020 මාර්තු මස 31 වැනි දින හෝ ඊට පෙරාතුව ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගනු ලැබීමට යටත්ව;

(ඇ) සිලින්ඩර් ධාරිතාව 1,800 සී.සී. නොඉක්මවන පෙට්‍රල් මෝටර් වාහනයක් හෝ සිලින්ඩර් ධාරිතාව 2,300 සී.සී. නොඉක්මවන ඩීසල් මෝටර් වාහනයක් හෝ එන්ජිමෙහි බලය කි.වො. 200 නොඉක්මවන විදුලි බලයෙන් ක්‍රියා කරන වාහනයක් මත, අදාල වන පරිදි, එකී යම් වාහනයක් 2019 මාර්තු මස 06 වන දින සිට 2019 ඔක්තෝබර් මස 31 වැනි දින දක්වා වන කාලසීමාව තුළ කරන ලද අත්තිකාරම් ගෙවීමක් පදනම් කරගෙන එකලස් කරන ලද බවට රේගු අධ්‍යක්ෂ ජෙනරාල්වරයා සෑහීමට පත්වන්නේ නම් සහ 2020 මැයි 31 වැනි දිනට පෙරාතුව ශ්‍රී ලංකා රේගුවෙන් නිදහස් කරගනු ලැබීමට යටත්ව,

කෙසේ වුවද, උක්ත (අ) සහ (ආ) උපවගන්තිවල සඳහන් ණයවර ලිපියට කරනු ලබන සංශෝධන පහත කොන්දේසි තෘප්ත කරන්නේ නම් සහ ආනයනකරු විසින් යහපත් අරමුණින් කරනු ලබන්නේ නම් එම සංශෝධන භාණ්ඩාගාර ලේකම්වරයාට සලකා බැලිය හැකිය.

(i) ඉහත ණයවර ලිපියේ සඳහන් මෝටර් වාහනය පුද්ගලික පරිහරණය සඳහා පමණක් ආනයනය කළයුතු අතර වාණිජ පරමාර්ථයෙන් ආනයනය නොකළ යුතු වීම,

(ii) ඉහත ණයවර ලිපියේ සඳහන් මෝටර් වාහනයට අදාල සංශෝධිත ණයවර ලිපිය සඳහා භාණ්ඩාගාර ලේකම්ගේ අනුමැතිය ලබාගත් පුද්ගලයාගේ නමින් පමණක් ලියාපදිංචි විය යුතු වීම,

(iii) මෝටර් වාහනය පළමු ලියාපදිංචි දිනයේ සිට වසරක් ගතවන තුරු වෙනත් පුද්ගලයකුට එම මෝටර් වාහනය පැවරිය නොහැකි වීම, සහ

(iv) එකී සංශෝධිත ණයවර ලිපිය බලාත්මක කිරීමට භාණ්ඩාගාර ලේකම්තුමන්ගේ අනුමැතිය සඳහා වන ඉල්ලීම උක්ත (i), (ii) හා (iii) කොන්දේසි සහ එකී ණයවර ලිපිය සංශෝධනය කිරීමට හේතු ඇතුළත් කරමින් දිවුරුම් ප්‍රකාශයක් මගින් පමණක් භාණ්ඩාගාර ලේකම්ට ඉදිරිපත් කළ යුතුය."

**මහින්ද රාජපක්ෂ,**
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍ය.

2020 මැයි මස 26 වැනි දින,
කොළඹ 01,
මුදල්, ආර්ථික සහ ප්‍රතිපත්ති සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

07 - 126

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.